







19 වන පිටෙන්

කෑමට මන්දිරය කරා පැමිණි ජෙරමියස් දියෙස් රේන්ද මහත්මයා කෑමෙන් පසුව තම මැතිනිය සෙලෙස්තිනා රුද්‍රිගු ජෙරමියස් දියෙස් මාතාව අමතා කීවේ අපූරු කතාවකි. "නායක හාමුදුරුවො කීවා වගේම අපි දෙදෙනාම වෙසක් දවසේ උදේම පන්සලට ගිහින් අටසිල් සමාදන් වෙමු. අපේ දරුවනට අපිට දහවල් දානෙ සකස් කරලා පන්සලට ගෙනෙන්න කියමු. ඒ ගමන්ම මම තවත් එක් කාරණයක් ගැන හිතුවා. ඒ නම් අපි දෙදෙනාට වගේම සිල් අරගෙන සිටින අනෙක් අයටත් දානෙ දෙන්න කටයුතු යොදමු. ඒ වගේම පන්සල ඉදිරියේ මඩුවක් ගහලා පන්සලට එන දුගී මගී යාචකාදීන්ටත් ලැබෙනවා. එසේ දානෙ දෙන්නත් කටයුතු යොදමු. ඒ කතාව කාට කාටත් වෙසක් දවසේ කාබී සතුටු විය හැකියි යනුවෙන් පියාණන් කියා සිටි විට එය අසා සිටි දූ දරුවන්ට සතුටක් ඇතිවුණේ මෙසේ වූ වෙනස කාට කාටත් හොඳහිත පැතිරවීමටද හේතුවක් වූ නිසාමය.

මෙසේ පානදුරේ රන්කොත් විහාරයේ වෙසක්දා මහා දන්සලක්ද දෙන බව ප්‍රචාරය වූ හෙයින් අහළ පහළ විහාරස්ථානවල නාහිමිවරුන් මෙන්ම දායකයන් තුළ ද අමුතුම හැඟීමක් ඇතිවූයේය.

මෙසේ වූ වෙසක් පොහෝදා ජෙරමියෙස් යුවලගේ අටසිල් සමාදන් වීමත් දුගී මගී යාචකාදීන්ටත් විහාරස්ථානයට වන්දනාමාන උදෙසා පැමිණෙන්නටත් ඇරුණු වෙසක් දන්සලත් කාගේත් කතාබහට ලක්වූයේය. වැඩි දෙනකු ඒ දැක සර්ධා සිත් වඩා ගත්හ. තව තවත් පින්දහම් කෙරෙහි සිත් ඇත්තෝ වූහ. රන්කොත් විහාරය ඉදිරිපිට පාර අයිනේ ඉදි කරන ලද වෙසක් දන්සල ගොක්කොළවලින්ද එයින්ම සාදන ලද පහන් කූඩුවලින්ද අලංකාර විය. එකල වෙසක් පහන් හෝ කූඩු ක්‍රමය ඇරැඹී තිබුණේ නැත. මේ වසර වූයේ ක්‍රිස්තු වර්ෂ 1901 වැනි වෙසක් පසළොස්වක පොහොය දිනයයි. තමන්ගේ දෙමාපියන් පන්සලේ අටසිල්ගෙන බණ භාවනාවලට යොමු වෙමින් සිටියදී පෙරදි කතාබහ කර ගත්තා සේම ඔවුනගේ දූ පුතුන් සියලු දෙනාම අටසිල්ගත් අනෙක් උපාසක උපාසිකාවන්ගේ කටයුතු මෙන්ම එදින වන්දනාමානයට සපැමිණි සැදැහැවතුන් වෙනුවෙන්ද තම යුතුකම් මනාව ඉටු කරන්නට යුහුසුළු වූහ. ඒ සමඟම ප්‍රථම වරට වන්දනාකාර දුගී මගී යාචකාදීන් වෙනුවෙන් ඇති කරන ලද වෙසක් දන්සලේදී ඔවුන්ට සිතුසේ කෑමට බීමට සැලැස්සීම ගැනද ඔවුන් කටයුතු කළ බව පෙනිණ. පියාණන් විසින් කලින්ම දූ දරුවන්ගෙන් ඉල්ලා සිටි පරිදිම එසේ කෑමෙන් බීමෙන් සංග්‍රහ ලද දුගී මගී යාචකාදීන් වෙනුවෙන් සතපනහ බැගින් මුදලක්ද බෙදාදීමට කටයුතු යෙදිණ. එයද ඔවුනට අතිශය සතුටට හේතුවක් වූයේ එකල සත පනහකින් පවුලකට දින ගණනාවක් ගත කිරීමටද හැකියාව තිබුණු හෙයිනි. පානදුරේ ජෙරමියෙස් දියෙස් යුවල විසින් මෙසේ දෙන ලද වෙසක් දන්සල ඉන්පසු සෑම වෙසක් පොහොයක් පාසාම එසේ පවත්වාගෙන යන්නටද තීරණය කෙරිණ. මෙම වෙසක් දන්සල පිළිබඳව ඇසූ දුටු අනෙක් පළාත්වල පන්සල්වල දායක දායිකාවෝද තම තමන්ගේ ප්‍රදේශවල විහාරස්ථානවල මෙවන් වෙසක් දන්සල් පැවැත්වීමටද තිරණය කර ගත්හ. එය පහනින් පහන දැල්වෙනවා මෙන් පසු කලෙක වසරක් වසරක් පාහේ දිගින් දිගටම ගොස් මුළු රටේම නොයෙකුත් ප්‍රදේශවල වෙසක් දන්සල් පැවැත්වීමේ සාමූහික කටයුත්තක් බවටද පත්වූයේය.

එය සෙන්පති ඕල්කොට්තුමාගේ ලංකාවතරණයත් හා සමගම ඇතිවූ බෞද්ධ ප්‍රබෝධයේ පශ්චාත් ඵලයක් ලෙසින් සැලකිය හැකිය. වෙසක් දන්සල් පමණක් නොව විශේෂයෙන්ම අනුරාධපුරයේ "පොසොන් දන්සල්ද'' බිහි වූයේ පසුකලෙක මෙය මූලාශ්‍ර කරගෙනය.

පූජ්‍යවලානේ ධම්මානන්ද නායක හිමිපාණන්ගේ සුවිශේෂ ඉල්ලීම අනුව මෙසේ අටසිල් සමාදන්ව තම ජීවිතයේ අවසන් යුගයේ සදාචාර නව ගමනකට මුල්වූ ජෙරමියෙස් දියෙස් මැතිතුමෝ ඉන්පසුව වසරේ 1902 මාර්තු 24 වැනිදා හදිසියේ ඇතිවූ හෘදයාබාධයකින් අභාවප්‍රාප්ත විය. මේ වනවිට දියෙස් පවුලට රේන්ද ව්‍යාපාරය ඇතුළු ඉඩම් වශයෙන් වතු 181ක් අයිතිව තිබිණ. එම බූදලය පිළිබඳව ජෙමියෙස් දියෙස් මහතා ජීවතුන් අතර සිටියදිම වර්ෂ 1900 මාර්තු 13 වැනිදා ලියන ලද ඔප්පුවකින් දෙදෙනාම අත්සන් කර තමන්ගෙන් කෙනකු කලින් මියගියහොත් අනිත් අයට සියලුම බූදලයට අයිතිවන ලෙස වගන්තියක් ඇතුළත් කර ඔප්පුවකින් අන්තිම කැමැති පත්‍රයක් ලියා තිබිණ. ඒ අනුව සිය ස්වාමියාගේ මරණයෙන් පසුව ජෙරමියෙස් දියෙස් සෙලෙස්තිනා රුද්‍රිගු මැතිනියට එම මුළු බූදලයම හිමිවිය. මෙසේ කලින්ම ලියා අත්සන් කර තිබූ හෙයින් කිසි බූදල් නඩුවකින් තොරවම හිමිකම රැකිණ.

පියාණන් ජීවතුන් අතර සිටියදි වුවද මෙවන්වූ මත්පැන් ව්‍යාපාරයට ආතර් වින්සන්ට් දියෙස් පුතා එතරම් සහයෝගයක් දුන්නේ නැත. පියා සමගත් එම ව්‍යාපාර කටයුතුවල වැඩිපුර නිරත වූයේ එඩ්මන්ඩ් විල්සන් පුතාය. සිය ස්වාමියාගේ මරණයෙන් පසුව සියලු ව්‍යාපාර තමතට ගැනීමෙන් පසුව වසර දෙකකින් හදිසියේ ඇතිවූ රෝගයකින් එඩ්මන් විල්සන් පුතා අභාවයට පත් විමෙන් අනතුරුව අම්මා මෙම ව්‍යාපාරය පවත්වාගෙන යාම පිළිබඳව පසුතැවිල්ලකට පසුවූවාය. තම පුත් ආතර් වී. දියෙස් අමතා ඇය කියා සිටියේ "පුතා අපි ටිකෙන් ටික මේ ව්‍යාපාරය අත්හැරලා දමමු.

අත්හැරලා දමලා එහි නියුතු අයට වැවිලි හා වෙනත් රැකී රක්ෂාවල නිරත වන්නට මග පාදා දෙමු. අවශ්‍ය අයට අපේ ඉඩකඩම්ද ලබාදෙමු'' යනුවෙනි. එය මේ වන විටද තම පවුලේ මත්පැන් ව්‍යාපාරය ගැන කලකිරි සිටි ආතර් පුතාට මහත් අස්වැසිල්ලක්ද විය."ඔව් මගේ අම්මා. ඒක වඩාත් හොඳයි. අපේ තාත්තා මෙහෙම මත්පැන් වියාපාරයෙන් හරි හම්බ කළ ධනය අපි මත්පැන් රටෙන්ම නැති කරන්නට වියදම් කරමු'' යැයි ඔහු එවේලේ කියා සිටියේ මහත්වූ සතුටකින් යුතුවය. පසුකලෙක එය එසේම සිදු කෙරිණ. එම දානපති අම්මාත්, ආතර් පුතාත් එකතුව තම ධනය එකල මහා බෞද්ධ විදුහල් බවට පත්ව තිබූ මරදානේ ආනන්ද, මහනුවර ධර්මරාජ, ගාල්ලේ මහින්ද ආදි විදුහල්වල දියුණුව පිණිසත් ප්‍රදේශයේ විහාරස්ථාන දියුණුව පිණිසත් අතදිග හැර වියදම් කළහ. මෙතෙක් කල් ලංකාවේ ධනවත්ම කාන්තාව වශයෙන් පානදුරේ රේන්ද නෝනා නමින් ප්‍රකටව සිටි සෙලෙස්තිනා රුද්‍රිගු ජෙරමියෙස් දියෙස් මැතිනිය පසුකලෙක පානදුරේ විශාඛාව නමින් හැඳින්වෙන්නට කරුණු සැලසිණි. ඒ අනුව එතුමිය ප්‍රථමයෙන් වර්ෂ 1917 දි කොළඹ නගර සභාව අසල ආරම්භ කරන ලද කොළඹ බෞද්ධ කාන්තා මහා විද්‍යාලය පසුකලෙක වර්ෂ 1927 දී එවකට සිටි ශ්‍රීමත් හර්බට් ස්ටැන්ලි ආණ්ඩුකාරතුමා සහ ආර්යාව අතින් විවෘත කෙරුණේ බම්බලපිටියේ "විශාඛා විද්‍යාලය'' නමිනි. ඉන්පසුව එයින් ලංකාවට පමණක්ද නොව ලෝකයටද දැන උගත් බාලිකාවන් කාන්තාවන් රැසක්ම බිහි කළාය. මේ ගෙවී යන්නේ සෙලෙස්තිනා රුද්‍රිගු ජෙරමියෙස් දියෙස් මැතිනිය බිහිකළ " විශාඛා විද්‍යාලයේ'' සියවෙනි සංවත්සරයයි. දැනුදු ඉහළම තත්ත්වයේ පවතින තම විද්‍යාලයේ දියුණුව පිළිබඳව මැතිනිය යහපත් තැනක සිට සතුටුවන බව කීම අතිශයෝක්තියක් නොවේ.